# 27

# චෛතසික සංවරණය සංරචනය කරන කාව්‍ය සංග්‍රහයක්

ප්‍රකට සාහිත්‍ය විචාරකයකු වන මහාචාර්ය කුලතිලක කුමාරසිංහ විසින් ලියන ලද කවි පොතක් වන **අසනිපාතය** දූන් නිකුත්ව ඇත.

කුමාරසිංහගේ **අසනිපාතය** කාව්‍ය සමුච්චය තිස් වසරක පමණ දීර්ඝ කාලයක් ජීවිතය තුළ තමා ලද විවිධාකාර අත්දැකීම් කවියට නැඟීමකි. තමා එදිනෙදා ලබන අනුභූතීන් ඇසුරෙන් කවියා කවි පබඳියි.

මෙය බොහෝ විට නිරායාසයෙන් සිදුවන්නකි.

ඊට හොඳම උදාහරණය සීගිරි ගී ය. සීගිරිය බැලීමට පැමිණි පෞරාණිකයෝ එහි වූ යම් යම් දෑ දැකීමෙන් පහළ වූ මනෝභාවයන් පද්‍යයන්ට පෙරළා කැටපත් පවුරේ ලියූහ. එලෙස ම මහාචාර්ය කුලතිලක කුමාරසිංහ තමා දුටු දෑ ඇසූ දෑ කවියකට පෙරළා සටහන් තබා පසුව එය 'අසනිපාතය' ලෙස පොතකට ගොණු කර ඇත.

අසනිපාතයේ ඔහුගේ ස්වතන්ත්‍ර නිර්මාණ රැසක් මෙන් ම ජපන් කවි රැසක සිංහල පරිවර්තන ද වේ. මහාචාර්ය කුමාරසිංහයෝ තම හද කම්පනය කළ එක් සිදුවීමක් මෙසේ නිරූපණය කරති.

'මගේ සිසුවකුය ඔබ
ඉගැන්වූයෙ ඔබට
මිනිස්කම ගැනය මම
ලේ පහස නිති විඳින වීරයකු විලසිනේ
රුවැති කෝමළ ළඳක්
මරුගෙ දෝතට හළේ
මෙමා දුන් සිප් සතර
එයයි ඔබ සිතනවද
නොහැකි මට සිසුවෙකැයි කියා ඔබ අමතන්න.
සිප්සතර දී මෙමා බිහි කළේ
විසිවන සියවසේ
අංගුලිමාල වෙද
මහ'දඹර එදා සිට
අමාවක වෙස් ගෙණැ'ත
පසුතැවිලි සිත සමඟ
ගැටෙමි මම නිරතුරුව



මේ කව ඔහු රචනා කොට ඇත්තේ 2000.11.07 වැනිදය. සැබෑ සිද්ධියක් ඇසුරෙන් ඔහු මෙය නිර්මාණය කොට ඇත. තරුණ සරසවි සිසුවකු කැලණි සරසවි බිමේදීම සිය පෙම්වතිය පිහියෙන් ඇණ මරා දැම්මේ ඒ ශෝචනීය සිද්ධිය බොහෝ දෙනෙකුට අමතක නැතැයි සිතමි. මේ සිදුවීම අරභයා චිත්‍රපටයක් නිමවුණු අතර නවකතා කිහිපයක් ද ලියැවිණි.

ඒ දිනවල මේ සිදුවීම අරභයා ලියැවුණු කවි පුවත්පත් රැසක ම පළවී තිබිණි. කෙසේ වෙතත් කුමාරසිංහ මෙය දකින්නේ වෙනස් අයුරකිනි.

මේ සිද්ධියට සම්බන්ධ සිසුවා ඔහුගේ හොඳ ම ගෝලයෙකි. සිසුවාගේ පෙම්වතිය ද කුමාරසිංහ හොඳින් දනී.

'දෙදෙන ඔබ මගෙ සිසුන්
බැඳුණු බව අසා සෙනෙහස හදින්
පුද කෙළෙමි මහද බැති සිත එදා
කිම එහෙත් සිදුවුණේ'

තමාගේ ආසිරි මැද ම එලගැන්වුණු මේ ප්‍රේමය ශෝකාන්තයක් වීම ගැන කවියා දුක්වෙයි. ඔහු තමාට දෙස් පවරා ගනියි. උක්ත කවියා නිරතුරුව තම සිසුනට මිනිස්කම ගැන, ප්‍රේමය ගැන, දයාව ගැන කියා දෙන අයෙකි.

එමෙන්ම ඔහු මානව හිතවාදී ගුරුවරයකු ලෙස සරසවි ශිෂ්‍ය ප්‍රජාව අතර පිළිගැනීමක් ලබා ඇති අයෙකි.

ඔහු මේ ශිෂ්‍යයා හා ශිෂ්‍යාව අතර වැඩුණු පෙමට ආසිරි පතයි. එනිසාම ඔහුගේ සිත වඩාත් රිදෙයි.

'මෙද සිප්සත දුනද හිතවතුනි
මම නිබඳ
බියෙන් පසුවෙමි
ආලවකයකු දිනක
දස දිශා දෙදරවා
මහ පොළොව ගුගුරුවා
මෙමා අළු දූලි කර
හෙළාවිද මෙබිම මත'

තමා සිප් කිරි පෙවූ දරුවන් මෙලෙස ක්‍රෝධයෙන් සිහිවිකල්වූ අපරාධකරුවන් වීම ගැන ගුරුවරයකු වන කවියා දෙස් නඟා ගන්නේ තමාට ම ය.

ආලවක තමා ගොදුරු කරගනීවිද කියා ඔහු බියවෙයි.

මින්පසු මගේ අවධානය දිනාගත්තේ 2002.06.05 දින ඔහු රචනා කළ කවියකි.

'රෝස මලක පෙති රැඳි ඒ
රෝස පැහැය බැබළෙන
වටකුරු මුව ඉඳුනිල් නෙත්
රෝස පැහැති යුවළ අදර
ඒ සෙනෙහැති ළඳ කවුරුද
කියනු මැනවි මට විගසට
මෙයද සිහිගන්වන්නේ සීගිරි කවියකි.

තමා සීගිරි ගලේ දුටු යුවතියකගේ රුව වනා ඇය කවුරුන්දැයි විමසීම සීගිරි කවි අතර සුලබය.

එවැනි ආභාසයක් ලැබුවද තම නිර්මාණ ස්වීය ලෙස වර්ධනය කරගන්නට කුමාරසිංහ සමත්ව සිටී.

මේ පද්‍ය සීගිරි ගීයකට සමීප වන තව ආකාරයක් ද වේ.

ඒ සංක්ෂිප්තභාවය අතිනි.

තමා තුළ මතුවන හැඟීම් කවියකට/ගීතයකට නඟද්දී එය හැකිතාක් සංක්ෂිප්ත කොට කුඩා වැකි කීපයකින් ඉදිරිපත් කළ හැකි නම් එය දුර්ලභ කවි ශක්තියේ ලක්ෂණයකි.

ඒ දුලබ කවි හැකියාව කුමාරසිංහ සතු බව මේ කවුද යන විද්‍යාම නිදසුනකි.

***- මනෝජ් -***

"වරෙන්තුව" මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන්ගේ තෙවෙනි කාව්‍ය සමුච්චයයි. **නැත ලොවේ අන් රසඳුනා** සහ **අසනිපාතය** නම් කාව්‍ය සංග්‍රහ දෙකෙන් කාව්‍ය කරණය පිළිබඳ රුචිය හා කුසලතාව පළකළ ඔහුගේ **වරෙන්තුව** නම් කාව්‍ය සංග්‍රහයෙන් සිය ප්‍රතිභාව, බහුශ්‍රැතතාව හා සතතාභ්‍යාසයෙන් ලද නිර්මාණ කුසලතාව පිළිබිඹු කෙරේ.

කවිය වනාහී කවියාගේ මනෝභාවයන්ගේ සංචරණය පිළිබිඹු කෙරෙන භාෂාමය දර්පණ තලයකි. කවිය අව්‍යාජ වන්නේ කවියාගේ වේදිත නමැති දිය පොහොර කවිය නැමැති තුරට උරාගනිමින් නිරංකුස ව ස්වතන්ත්‍ර ව ස්වකීය අනන්‍යතාව පාදක කොට ගෙන කවිත්වය නමැති මල් සම්පත මුල් කරගෙන ආස්වාදනීය වූ ඵල සම්පත් ලබාදෙන කල්හිය. කාව්‍යමය පරිකල්පනයෙන් ප්‍රතිනිර්මාණය නොවුණු හුදු අනුභූති කථනය මතුපිට තැවරෙන භාෂාලේපයක් පමණි. එකම අත්දැකීම වුව ද ඒ ඒ කවියාගේ ප්‍රතිභාව, කාව්‍යමය පරිකල්පනය, පුරුෂාර්ථ හා දර්ශනය අනුව විවිධාකාරයෙන් ප්‍රතිනිර්මාණය විය හැකිය. නිර්මාණ ලෝකයෙහි පවතින විචිත්‍රතාව ද එයයි. සාහිත්‍ය කලාවන්ගේ අසීමිතභාවය රඳා පවතින්නේ ද මෙකී විචිත්‍රතාව නිසාය.

ස්වකීය උත්පාදක ශක්තිය ප්‍රධාන සාධනාව කරගන්නා සංවේදී කවියා තමා තුළ පවත්නා ජීවිතාවබෝධය හා ජීවිතාකල්පය සිය



නිර්මාණ මගින් මුදා හරියි. සහෘදයා තමා සමඟ හෘදය සංවාදයකට පමුණුවා ගන්නට කවියා සමත් වන්නේ නම්, ඔහුගේ වේදිත සම්ප්‍රේෂණය බොහෝ දුරට සාර්ථක වන්නේ ය. චමත්කාරජනක ලෙස එකී කාව්‍යමය හා භාවමය ආමන්ත්‍රණය සඳහා නිර්මාණශීලී කවියෙකුට භාවිත කළ නොහැකි උපක්‍රමය කුමක් ද?

**වරෙන්තුව** කාව්‍ය සංග්‍රහයෙහි ඇතුළත් බොහෝ නිර්මාණවලින් විශදවන්නේ, මිනිස් මනසෙහි පවතින ද්විත්ව ඝට්ටනයයි. චංචල වූ ද දුරක්ෂ වූ ද දුර්නිවාරය වූ ද ස්වාත්ම කේන්ද්‍රීය වූ ද මිනිස් සිත නිරන්තරයෙන් ලෝභය, අලෝභය, රාගය, විරාගය, ආදරය අනාදරය සොම්නස දොම්නස ආදී ද්විඝටනාත්මක චෛතසික අතර දෝලනය වෙයි. ලොව මැවෙන්නේ ද ගැටෙන්නේ ද නැසෙන්නේ ද මේ ද්වෛතය නිසාය. අද්වෛතය විසංකාරය සඳහා හේතු වේ. භෞතික ලෝකයේ මෙන් ම භාවික ලෝකයෙහි ද මේ ගැටුම පවතී. ඒ සඳහා කාලය අවකාශය හා විවිධ ප්‍රපංච හේතුකාරක වේ. මෙකී යථාර්ථය **වරෙන්තුව** කාව්‍ය සංග්‍රහයේ අධිකාරී සූත්‍රය වී ඇත.

**ආදරය** නම් කාව්‍ය නිර්මාණයෙහි කවියා ආදරයෙහි රමණීයත්වය දකින්නේ එහි ඇති ද්විඝටනාත්මක ලක්ෂණය නිසා ය. පහත දැක්වෙන්නේ එම නිර්මාණයෙහි උධෘතස්ථාන කීපයකි.

" විටෙක හද ගිනි නිවන
විටෙක හද ගිනි ලවන

සුමුදු මුදු ගුණ රැඳුණු
රුදුරු විෂ කටු පිරුණු

හද බඳුන උණු කරන
හද අඹර තුරු උයන
මල් පිපුණු සුවඳ ඇති
දිවි අරුත එළි කරන
සෙනෙහසේ දළු පිපෙන

රමණීය හැඟුමක්ද?
රමණීය දැකුමක්ද?
රමණීය පැතුමක්ද?
රමණීය ආදරය

ආදරය මෙබඳු යැයි නිශ්චිතව ම නිර්වචනය කළ නොහැකිය. එය අනිර්වචනීය වේ. අප ආදරය ලෙස විඳින්නේ ඒ රමණීය වූද මරණීය වූ ද තත්ත්ව සංයුතිය යි. කවියා එකී යථාර්ථය කාව්‍යමය ස්වරූපයෙන් නිරූපණය කර තිබේ.

මෙම කාව්‍ය සමුච්චයෙහි ඇතුළත් **මුහුණ**, **සොඳුරු සඳමඬල**, **ළඳ**, **හරණගණිතාචාර්යගෙන්**, **සොඳුරිය**, **පබවත ඔබ**, **මගේ චූටි**,

**පෙම්වතෙකුගේ හැඟුමක්, සිත නොදෙන, ළතැවිල්ලක්, මිණ** යන නිර්මාණවල ළඳක, සඳක, ප්‍රේමයක ජීවිතයක රැඳී බැඳී පවතින වින්දනීය වූ ද ආනන්දනීය වූ ද ස්වභාවය දිස් වේ. මිනිස් සිතෙහි පහළවන කාමී උදෙයා්ගය එම නිර්මාණවල ලැඟුම් ගෙන සිටී.

**මා සතු වූ ජීවිතය, මහලු විය, රංචාගොඩ ළමයාගේ කවි, ඇයි? මතකය, කවුද? නවසඳ, සඳලිය, සොඳුරිය, ජීවිතය, වරෙන්තුව, සිඳීගිය සෙනෙහස, නික්ම යාම, සැඟවිය නොහැකිය, මරණයයි ජීවිතය, ගෙවීයන ජීවිතය,** එදා අද, වැනි නිර්මාණ ළඳක, සඳක, ප්‍රේමයක, ජීවිතයක රැඳී බැඳී පවතින රළු, පරළු, කටුක නොසියුම්බව හා නිරානන්දනීය ස්වභාවය පිළිබිඹු කරයි. විටින් විට මිනිස් සිතෙහි ඇතිවන චෛතසික දෝලනය අභ්‍යන්තර ඝට්ටනය නිරූපිත මෙම නිර්මාණ ඇසුරින් රසික මනසෙහි ද සොම්නස, දොම්නස, සාංකාව, කුතූහලය වැනි සංකීර්ණ මනෝභාවයන් ප්‍රබෝධනය කරන්නට කවියා සමත් වේ. මෙහි ඇතුළත් බොහෝ නිර්මාණවලින් සහෘදයා චින්තාපරවශ කරවයි.

"තාත්තා" නම් නිර්මාණයෙන් ද නුවණ මුහුකුරා නොගිය ජීවිතාවබෝධයෙන් නොපිරුණු කොලුගැටයකු කෙමෙන් කාලය සමග ගැටෙමින් මව්පිය ඇසුරින් මිදී ස්වතන්ත්‍ර වීමට වෙර දරන අයුරුත් ඔහුගේ තත්කාලීන චිත්තාචාරයත්, පසුව ජීවිතය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ජීවන පරමාර්ථ සාධනය කරගත් වැඩිහිටියෙකු බවට පත්ව එදා සිය පියාණන් අඥාදායකත්වය තුළ සඟවාගෙන සිටි පුත්‍රස්නේහයත් ප්‍රත්‍යක්ෂ කර ගනිමින් පීතෘස්නේහයෙන් ඔදවැඩෙන ආකාරයත් නිරූපිතය.

" බොකුටුය හිස කෙස්
පළල්ය උරහිස්
රැළි ගැන්වී ඇත නළල
ඇත ඉදිරියට නෙරා උගුරු ඇටය
උල් කටුවක් සේ
උස් නූස් තරමය.

කවියා පළමුව තාත්තාගේ චිත්තරූපයක් සහෘද මනසේ චිත්‍රණය කරයි. නිර්මාණයෙහි පළමු අර්ධයේ දී තාත්තා පිළිබඳ පළ කෙරෙන්නේ අප්‍රසාදයකි. නිතර සිය ක්‍රියා කලාපය පිළිබඳ විමසිලිමත් වෙමින් ඊට එරෙහි වන රළු ආඥාදායකයකු ලෙස කථකයාට පියා දිස් වේ.

" බැම ඔසවා
බලා මා දෙස
නොයනු! ගමේ කොලුවන් හා සෙල්ලමට
කීව ද එසේ
මා සිටින්නේ පිටවී යන තුරුය නිවසෙන් ඔහු
ඒ මගේ පැතුමය එකල......



මෙහිදී කවියා සහෘදයාගේ ද ළමා විය පිළිබඳ ස්මෘති අවදි කරවා ස්වකීය අනුභූතිය සහානුභූතියක් කරවන්නට සමත් වෙයි.

" දුටු සඳ මා ගමේ කොලුවන් හා
හුරේ දමමින් චක්ගුඩු පනින විට
ඒයි.....නැද්ද උඹට පාඩම් කරන්නට
පළ ගෙදර නොරැඳී මේ ජඩයන් හා........
ගමේ කොල්ලෝ ද එසඳ
හූවෙන් සංග්‍රහ කළහ මපියාණනට........
මට ද සතුටකි... එකල........

සෙල්ලක්කාර ළමා මනසක ගතිස්වභාවය මෙසේ නිරූපණය කරන කවියා - කෙමෙන් ජීවිතය පිළිබඳ ගුණ නුවණ ලබන කථකයා සිය පියාණන් ආඥාදායකත්වය තුළ සඟවාගෙන සිටි පුත්‍රස්නේහයේ සැබෑ රුව හඳුනා ගන්නේ තමා අවට සමාජයේ ගතිලක්ෂණ ප්‍රත්‍යක්ෂ කර ගැනීමෙනි.

" ගම එදා හැඩි දැඩිය
විරහිතය.......අනුකම්පා
අ.පො.ස. සාමාන්‍ය පෙළ
සමත් වූ බැව් ඇසූ ගම්මුන්
අවි අමෝරා ගත් සේය.
ගමෙන් මා පමණය සමත් වූයේ
කුමන හෝ වරදකට
හසුකර මා ගෙළ මුලින්
නීතියේ රැහැනට ගොදුරු කර
මාගේ ජීවිත ගමන
බිඳහෙළීමය.......
බොරු වළකට හෙළීමය
ඇටවීමය උගුල්
නිති දැරූයේ වෙර"

කවියා ස්වකීය අතීතාවර්ජන සිතට ගලා එන අයුරින් නිදහසේ ගලායන්නට සලසන්නේ වර්තමානයේ සිට අතීත පිය සෙනෙහස හඳුනාගැනීමෙන් භාවාතිශය වී ඇති බැවිනි. මෙම භාවාවේග තවදුරටත් සංයමයෙන් හා සංක්ෂිප්තතා ගුණයෙන් යුක්තව රචනා වූයේ නම්, වඩාත් යෝග්‍ය නොවන්නේදැ යි කෙනෙකුට හැඟීයාමට අවකාශ තිබේ. එහෙත් මෙහිදී කවියා ආඛ්‍යාන රීතිය ඇසුරු කර ගනිමින් අප තුළ පහන් සංවේගයක් දැනවීමට සමත් වී ඇත.

" කොල්ලන්ගෙ ඇසුරෙන්
පුතේ! උඹෙ දිවි
නතර විය හැක
දිවැස් බැල්මෙන්
එදා කී එවදන් තාත්තේ......
ඔබයි මගේ අනාගත වක්තෘ......

මෙම නිර්මාණයෙහි ඇතුළත් මෙබඳු යෙදුම් හා සංකල්පනා අපට කුමරතුඟුවන්ගේ "පියසමර" සිහි ගන්වයි. එසේ ම කාලය විසින් ලබාදෙන ජීවිතාවබෝධය හා සාධුත්වය පුද්ගලයා තුළ ඇති කරවන පරිවර්තනය කවියා ප්‍රත්‍යක්ෂ කරවයි.

" ඔබයි මගෙ ඉටු දෙවි
එදා විරසක වී
ඔබ බසට වෙර කළ ද
අදයි මට ඔබ අග මෙහෙ
මෙනෙහි කර සිත පුබුදු කළ හැකි.
නැත ද ඔබ දිවි කතර
ඇත ඔබ සසර කතර
ඔබේ ම පුත් වීමට
පුරමි පෙරුම් ඉත සිතින.

කවියා ස්වකීය හැඟීම් අව්‍යාජ ලෙස හසුරුවමින් පිතෘත්වය පිළිබඳ හෙළිකරන යථාර්ථය සහෘද මනසට ද සාධාරණීකරණය වේ.

වරෙන්තුව කාව්‍ය සංග්‍රහයෙහි ඇතුළත්, ගුරුතුමිය, විමල් දිසානායකට, පරාක්‍රම කොඩිතුවක්කු, සෝමහිමි යන නිර්මාණ හුදු පුද්ගලාභිවාදන නොව පුද්ගලයා, සමාජය හා කාලය පිළිබඳ පරිණාමය හා විචලනය පුද්ගලාන්තර බැඳීම්, සහෘදභාවය ද ජීවිතයේ ස්වභාවය ද පසක් කර දෙමින් පහන් සංවේගයක් දනවන නිර්මාණ ලෙස හැඳින්විය හැකිය.

සිංහල සමාජීය හා සංස්කෘතික ස්වභාවය අනුව අතීතයේ සිට ම කවිය භාව විරේචනය, භාවවිශෝධනය හා භාවෝපසමනය සඳහා බහුල වශයෙන් ම උපයෝගී කරගත් මාධ්‍යයකි. එහිදී ඒ ඒ කවියාගේ ප්‍රතිභාව, බහුශ්‍රැතතාව, හා සතතාභ්‍යාසය ද ජීවිතය හා ලෝකය කෙරෙහි ඔහු හෙළන දෘෂ්ටිය ද අනුව නිර්මාණ අනන්‍යතාව පිළිබිඹු වේ. එමගින් කාව්‍ය ක්ෂේත්‍රය විචිත්‍ර ලක්ෂණ උරුමකර ගනිමින් පෝෂණය වේ. "වරෙන්තුව" නම් කාව්‍ය නිර්මාණ සංග්‍රහයෙන් මහාචාර්ය කුලතිලක කුමාරසිංහයන් සතු එකී කාව්‍යකරණ සාධනා මැනවින් ප්‍රදර්ශනය වේ.

*මහාචාර්ය දර්ශන රත්නායක*

# 28

# සාර්ථක කවියක් බිහිවීම වූ කලී...

*උදේනි සරච්චන්ද්‍ර*

සාර්ථක කවියක් බිහිවීම වූ කලී අපූර්ව වස්තු නිර්මාණයකි. එම නිර්මාණය තුළ අපූර්වත්වය ඇති වන්නේ කවියා සතු ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය සහ සතතාභ්‍යාසය තුළිනි. එසේ බිහිවන කවිය සහෘදයා තුළ කම්පනයත්, ප්‍රකම්පනයත් ජනිත කරමින් නාද නින්නාද දෙයි.

අනිකුත් සාහිත්‍යාංග සමගින් කාව්‍යකරණයට ද ආසක්ත කුලතිලක කුමාරසිංහ කිවිඳුන්ගේ තෙවන කාව්‍ය සංග්‍රහය ලෙසින් "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහය පළ කර ඇත. මීට ඉහතදී "නැත ලොවේ අන් රසඳුනා" සහ "අසනිපාතය" නමින් කාව්‍ය සංග්‍රහ දෙකක් පළ කර ඇති කුමාරසිංහ කිවිඳුන්ගේ "වරෙන්තුව" කාව්‍ය සංග්‍රහය විවිධ කාව්‍යා කෘතිවලින් සමලංකෘතය. කවියා සිය අත්දැකීම් සූචනය කිරීම සඳහා විවිධ කාව්‍යාකෘති උපයෝගී කරගෙන ඇත්තේ එම අත්දැකුමේ හැඩරුවට අනුරූපවන ලෙසිනි.

පද්‍ය රචනා හතළිස් අටකින් සමන්විත මෙම කාව්‍ය සංග්‍රහයේ ජීවිත යාත්‍රාවේ විවිධ ඉසව් පිළිබඳව රචනා කර ඇති පද්‍යයන් ගෙන් විශදවන්නේ කවියාගේ වින්දනීය අත්දැකීම් ය. කාලයාගේ ගලායෑමත් ඒ හා සබැඳි ප්‍රේමනීය හා ඛේදනීය අත්දැකීම් මෙහි සංගෘහිතය. කුමාරසිංහ කිවිඳුන් විසින් රචිත ප්‍රේමනීය කාව්‍ය රචනා අතර "සඳමඬල" කාව්‍ය රචනාව කැපී පෙනේ. මෙහිදී කවියා ප්‍රේමයේ සුසිනිඳු බව සුපුන් සඳ සේ දකිමින් කවි බස රූපකාර්ථවත්ව යොදා ගෙන ඇත.

" මැදියම් රැයෙ නැගිට
ඔබේ සුදු මුහුණ දෙස
මා බලා සිටින සඳ
පොහොය පසළොස් රැයේ
තුරු අතර සැඟව සිටි
මඬල පුරසඳ හොරෙන්
මගේ සිත හඳුනාගෙන."

එමෙන්ම "ළඳ" නමැති පද්‍ය රචනය තුළින් සියුමැලි ළඳකගේ වත කමල සඳමඬල නොව අරවින්දයක් ලෙස චිත්‍රණය කර ඇත්තේ උචිත වාං මාලාවකිනි.